ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යාල සහායක තනතුරු සඳහා බඳවා ගැනීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යාල සහායක තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**(1) බඳවා ගැනීමේ සුදුසුකම් :-**

අධ්‍යාපන සුදුසුකම්

- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

**(2) වයස - අවු.18-45 අතර විය යුතුය**

**(3) බඳවා ගැනීමේ ක්‍රමවේදය :-**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම් සිදුකරනු ලබන අතර, පත්කිරීම් සිදුකරනු ලබන්නේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය යන දෙකම සඳහා ලබාගත් ලකුණු පදනම් කරගෙනය.

**(4) වැටුප :- TRC 10.3 - රු.38,080 (10x480)-(10x680)-(10x1020)-(10x1360)-රු.73,480.**

**(5) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය - 2023.12.19**

**(6) පොදු කොන්දේසි :-**

- මෙම පත්වීම ස්ථිර පත්වීමක් වන අතර වසර 03ක පරිවාස කාලයකට යටත් වේ.
- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අදාළ සුදුසුකම් සපුරා නොමැති සහ අයදුම්පත සමග සහතික කරන ලද අධ්‍යාපන සහතිකවල පිටපත් ඉදිරිපත් කර නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පිළිබඳව සළකා බලනු නොලැබේ.
- බඳවාගනු ලබන තනතුරු ප්‍රමාණය හෝ බඳවා ගැනීම කල්දැමීම/අවලංගු කිරීම් පිළිබඳව තීරණ ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතුය.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යනු නියාමන ආයතනයක් වන බැවින් එහි සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තෙකු විසින් ඔහුගේ/ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයෙකු කොමිෂන් සභාවේ නියාමන පාලනය යටතේ පවත්නා ආයතනයක තනතුරකට බඳවා ගැනීම හෝ පත්කිරීමට සෘජුව හෝ වක්‍රව අනුබල දීම/දිරි ගැන්වීම හෝ පෙනී සිටීම සිදු නොකළ යුතුය.

**(7) අයදුම්කරන ක්‍රමය :-**

මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙල කළ අයදුම්පත්, අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් සමග අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්කරු දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් තනතුර සඳහා තෝරාගත හොත් මුදාහැරීමට බාධාවක් නොමැති බවට අදාල ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව අයදුම්පත ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"කාර්යාල සහායක තනතුර සඳහා බඳවා ගැනීම - 2023"** ලෙස සඳහන් කළ යුතුය. අයදුම්පත් **www.trc.gov.lk** වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය.

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යාල සහායක තනතුර සඳහා අයදුම්පත්‍රය -2023**

- සම්පූර්ණ නම (සිංහල/දෙමළ) :
- සම්පූර්ණ නම (ඉංග්‍රීසි) :
- මුලකුරු සමග නම(ඉංග්‍රීසි) :
- ලිපිනය :
- ස්ත්‍රී/පුරුෂ භාවය :
- දැනටමත් රජයේ සේවයේ නියුතු අයෙක් නම් - වර්තමාන තනතුර සේවය කරන ආයතනය:
- උපන් දිනය :
- වයස (අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට) : අවුරුදු : ........... මාස : ........... දින : ...........
- දුරකථන අංකය : ජංගම - නිවස -
- විද්‍යුත් ලිපිනය :
- ජාතික හැඳුනුම්පත්/විදේශ ගමන් බලපත්‍ර අංකය :
- අධ්‍යාපන සුදුසුකම් :
- වෘත්තීය සුදුසුකම් :
- වෙනත් සුදුසුකම් :
- අමුණා ඇති සහතික පිටපත් 1.<br>2.<br>3.<br>4.

මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය : ................./ ............/ ............... අයදුම්කරුගේ අත්සන : ..................................................

- නිලධාරියා සේවය කරන ආයතනයේ ප්‍රධානියාගේ නිර්දේශය: ඉහත තනතුර සඳහා තෝරාගත හොත් නිලධාරියා මුදාහැරීමට බාධාවක් නොමැති බවට නිර්දේශ කරමි

දිනය : ................./ ............/ ............... ආයතන ප්‍රධානියාගේ අත්සන : ...........................................

නම: .......................................

තනතුර: .......................................

නිල මුද්‍රාව:

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,**
**නො.276, ඇල්විටිගල මාවත,**
**කොළඹ 08.**

SELACINE